# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/15/06/24 | ඔබේ අංකය / உனது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2022.09. 26 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, සභා ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
ලේකම්(ප්‍රධාන/ක්‍රීඩා/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර) අමාත්‍යාංශය,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා/සැලසුම්),
දෙපාර්තමේන්තු ප්‍රධානින්,ප්‍රාදේශීය ලේකම් වෙත.

<u>2023 වසර සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.</u>

2023 වසර සඳහා දකුණු පළාත් සභාවේ සියලුම අමාත්‍යාංශ දෙපාර්තමේන්තු ආයතන වලට අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ,සේවාවන් සැපයීම හා ඉදිකිරීම් සඳහා ලියාපදිංචි වීමට කැමති සැපයුම්කරුවන් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කර ගැනීම සඳහා අදාළ පුවත්පත් දැන්වීම 2022.09.26 දිනමිණ ,ඩේලි නිවුස් ,තිනකරන් යන පුවත්පතවල පළකර ඇත.
ඒ අනුව සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලෙස දකුණු පළාත් සභාවේ ලියාපදිංචි වීමට අපේක්ෂා කරන සැපයුම්කරුවන්ට/කොන්ත්‍රාත්කරුවන්ට මේ සමග ඉදිරිපත් කර ඇති අයදුම් පත්‍රය සම්පූර්ණ කොට 2022.12.20 දිනට පෙර ප්‍රධාන ලේකම් කාර්යාලයට භාර දෙන ලෙස ඔබගේ සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කරන ලෙස දන්වමි.තවද sr.sys.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන්, 2023 **සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය** online ක්‍රමය ඔස්සේ ද සිදු කර ගත හැකිය.

එක් සැපයුම්කරුවෙක්/කොන්ත්‍රාත්කරුවෙක් එක් අයදුම් පතක් පමණක් ඉදිරිපත් කළ යුතුය.එක් අයදුම්පත්‍රයක් මගින් අයිතම ඕනෑම ප්‍රමාණයක් ලියාපදිංචි කළ හැකි අතර එක් අයිතමයක් සඳහා ලියාපදිංචි ගාස්තුව රු.300/- කි.ඔබ ආයතනයෙන් අදාළ ගාස්තුව ගෙවනුයේ නම් ඒ සඳහා දකුණු පළාත් සභා ලදු පතක් නිකුත් කර එම මුදල් විවිධ ආදායම් ශීර්ෂය (2003-99-00) යටතේ ගිණුම් ගතකර මාසික ගිණුම් සාරාංශය මගින් පළාත් භාණ්ඩාගාරයට වාර්තා කළ යුතුය.

තව ද අයිතම අංක 17 යටතේ ඇති ඉදිකිරීම් හා කොන්ත්‍රාත් සේවා සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචියේ දී පහත පරිදි ගාස්තු ගෙවිය යුතු අතර මෙයට අමතරව ඉදිකිරීම් හා කොන්ත්‍රාත් සේවා අයිතමයක් සඳහා රු.300/- බැගින් ද ගෙවිය යුතුය.

1. රු: මිලියන 02 ට අඩු කොන්ත්‍රාත් සඳහා (C 9 සහ C 8 ) - රු: 1,000.00
2. රු: මිලියන 02 සිට රු : මිලියන 05 දක්වා (C 8 සහ C 7) - රු: 1,000.00
3. රු: මිලියන 05 සිට රු: මිලියන 10 දක්වා (C 7 සහ C 6) - රු: 2,000.00
4. රු: මිලියන 10 සිට රු: මිලියන 20 දක්වා (C 6 සහ C 5) - රු: 2,000.00

මෙම ලියාපදිංචි කිරීමට අදාළ කොන්දේසි,නියමයන්,අයිතම විස්තර හා අයදුම් පත්‍රය, ප්‍රධාන ලේකම් කාර්යාලීය නිල වෙබ් අඩවියෙන් හා sr.sys.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

සුනිල් පෝද්දිවල.
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(මුදල්),
දකුණු පළාත.

සුනිල් පෝද්දිවල
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්)
ප්‍රධාන ලේකම් කාර්යාලය
දකුණු පළාත.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"සෞභාග්‍යමත් දකුණු පළාතක්"